2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : එලයිට් කෝපරේට් සොලූෂන්ස් ඇන්ඩ් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00201373
ලියාපදිංචි දිනය : 2018.06.28
ලියාපදිංචි ලිපිනය : අංක 711/33, 5 පටුමග, දහම් මාවත, කල්දෙමුල්ල, මොරටුව.

07-955/3

## සී/ස ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් සමාගම ණය හිමියන් මගින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම (පී බී 153)

මෙමගින් දනුම් දෙන පරිදි සී/ස ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් සමාගමේ ණය හිමියන්ගේ සහ සාමාජිකයන්ගේ රැස්වීමක් 2018 ජුලි මස 06 වැනි දින පෙරවරු 10.00 ට සහ 10.30 ට 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ දී පවත්වන ලද අතර එහිදී පහත සඳහන් යෝජනාවන් සම්මත කර ගන්නා ලදී.

සී/ස ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් සමාගම ණය හිමියන් මගින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය ගන්නා ලදී.

එකී රැස්වීමේ දී ණය හිමියන් සහ සාමාජිකයන් විසින් සම්මත කර ගන්නා ලද පරිදි අංක 03 ඊ, කිංසි පාර, කොළඹ 08, ලිපිනයෙහි පදිංචි කහඳවල ආරච්චිගේ කිත්සිරි පෙරේරා ගුණවර්ධන මහතා එම වසා දැමීම සඳහා ඈවරකරු ලෙස පත් කරන ලද අතර, අදාළ වසාදැමීම සඳහා සාමාන්‍ය ප්‍රමාණාත්මක ගාස්තු ඔහු විසින් අය කරනු ඇත.

ඈවරකරුට මෙහි දී 2007 අංක 7 දරන සමාගම් පනතේ සියලුම හෝ ඕනෑම බලතලයක් පාවිච්චි කිරීම සඳහා මෙමගින් බලය පවරන ලදී.

මේ හේතුවෙන් අධ්‍යක්ෂකවරුන් සතු සියලු බලතල අවසන් කෙරේ.

සී/ස ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී එස් එම්මානුවෙල් මෙනවිය,
සමාගම් ලේකම්.

2018 ජුලි මස 09 වැනි දින.

07-863

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ගෝල් වේ ලයිෆ් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 131299
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : දෙහෙල්ගමුව, ඉබ්බාගමුව, කුරුණෑගල
ලියාපදිංචි දිනය : 2018.03.29

සමාගමේ නම : විටා ෆාමා ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 131010
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 46, දයා නිවස, යටිවල, පිලැස්ස, කුරුණෑගල
ලියාපදිංචි දිනය : 2018.03.22

සමාගමේ නම : වින්ලයිෆ් ප්ලස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 130545
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නිමෙක්ස් මෝටර්ස් ඇන්ඩ් ඔයිල් මාර්ට්, 09 මයිල් පොස්ට්, ඉලුකේවල, වව්ඩ
ලියාපදිංචි දිනය : 2018.03.09

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

07 - 963

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොරටුව, රාවතාවත්ත, අර්නස්ට් පෙදෙස, අංක 6/1 හි පදිංචි එලන් හේමා වීරසේකර (විදේශගමන් බලපත්‍ර අංක M 2232173) වන මා විසින් මඩපාත, මාකන්ද, අංක 193 හි පදිංචි වීරප්පෙරුමාච්චි අතුකෝරාළගේ දෝන අනෝජා අතුකෝරාළ අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ජයන්ති රොද්‍රිගෝ මහත්මිය විසින් වර්ෂ 2007 ක්වූ අගෝස්තු මස 28 වන දින සහතික කරන ලද අංක 3724 දරණ ඇටර්නි බලය අද පටන් (2018-07-13) අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට වීරප්පෙරුමාච්චි අතුකෝරාළගේ දෝන අනෝජා අතුකෝරාළ යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වගනොකියන බව මෙයින් දන්වා සිටිමි.

07-941

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ස්පාඤ්ඤය, සී පී 28046, 91, 2 a , 3 a මැඩ්රිඩ්, පාසියෝ ඩි ලා කැස්ටල්ලානා හි ලියාපදිංචි කාර්යාලය පිහිටි යූ ටී ඊ සෙටාපි එලිප්සේ ආණමඩුව (හවුල් ව්‍යාපාරය) හි තනි කළමනාකරු වන අලිජාන්දෝ ටූඩුරි සිකර්මන් වන මා විසින් කොළඹ 05, ස්පැතෝඩියා ඇවනිව් අංක 15 හි පදිංචි කරදන ලේකමලාගේ දර්ශිකා නයනගංගා ගුණවර්ධන (ජාතික හැඳුනුම්පත් අංක 857330072 V දරන) යන අය වෙනුවෙන් ස්පාඤ්ඤයේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී ෆර්නැන්ඩු ඩී ලා කාමරා ගාර්සියා විසින් වර්ෂ 2016 දෙසැම්බර් මස 23 වැනි දින ලියා සහතික කරන ලද හා බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ දිනපොත් අංක 1269 හි 188 වෙලුම් හි 13 වන පිටුවේ වර්ෂ 2017 ජනවාරි මස 25 වැනි දින ලියා පදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙම දැන්වීමේ දින සිට වහා ක්‍රියාත්මක වන පරිදි බල රහිත සහ අවලංගු වන බව මින් ප්‍රකාශ කරන අතර මින් පසු ඇය විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට බලපැවැත්මක් නොමැති බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලු දෙනා හට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අලිජාන්දෝ ටූඩුරි සිකර්මන්,
තනි කළමනාකරු,
යූ ටී ඊ සෙටාපි එලිප්සේ ආනමඩුව,
(හවුල් ව්‍යාපාරය)

07-964

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බදුල්ල, මැඩිතලේ, මැඩිතලේ වලව්වෙහි පදිංචිව සිටි, දැනට කළුතර, ගාලුපාරේ, අංක 215/4, ලිපිනයේ පදිංචි ජා. හැ. අංක 501940356V හිමි, මද්දුම, රාළලාගේ දොන් ආරියදාස මද්දුමගේ වන මම, බදුල්ල, මැඩිතලේ, මැඩිතලේ වලව්වෙහි පදිංචි ජා. හැ. අංක 582822069V හිමි, මද්දුම රාළලාගේ දොන් සුනිල් චන්ද්‍රසේකර යන අයට, රත්නපුර ඩී. එල්. දුලානි සන්ධ්‍යාකුමාරි නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන ලවා අංක 223 යටතේ 2010.06.26 දින ලියා සහතික කරන ලද, රෙජිස්ට්‍රාර් ජෙනරල් දෙපාර්තමේන්තුවේ ඌව සබරගමුව කලාප කාර්යාලයේ, ඇටෝනි බලපත්‍ර ලේඛනයේ 05 කාණ්ඩයේ 51 වන පත්ඉරුවේ දිනපොත් අංක 159 යටතේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝනි බලපත්‍රය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ශ්‍රී ලංකා ජන රජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටින අතර, මින් ඉදිරියේ දී, එකී ඇටෝනි බලපත්‍රය අනුව ඔහු විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට වග නොකියන බවත්, දන්වා සිටිමි.

එම්. ආර්. ඩී. ඒ. මද්දුමගේ.

2018 ජූලි මස 13 වැනි දින.

07-945

---

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම

2018/2019 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගු සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරා බදු කොන්දේසිවලටත්, මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2018.08.29 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන් ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
(ආ) වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් තැබෑරුම අංක සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ සඳහන් කර ඇත. එකී වේලාවන්වල දී සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැළකිය යුතු ය.

08. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනත් යම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

09. මීට පෙර විදේශ මත්පැන් සැලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතු ය.

10. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2018 ජූලි මස
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2018/2019 වර්ෂය***

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2018.08.29 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000.00 ක් වේ.

07-972

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

**කැලණිය වලව්වත්ත පාරේ පිහිටි වරිපනම් අංක 37 දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 20ක් විශාලැති අගනා දේපළක්**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ කැලණිය (264) ග්‍රාම නිලධාරි වසමේ කැලණිය ගමෙහි පිහිටි මීගහවත්ත හෙවත් මෙසට්වීගේවත්ත නමැති ඉඩමට අවසරලත් මානක ලෙස්ලි එන් ප්‍රනාන්දු මහතා විසින් 2017.05.24 වැනි දින මැන සකස් කරන ලද අංක 8177 දරන පිඹුරේ ලොට් 25 A දරන ඉඩම සහ ඉහත කී ඉඩම මත ස්ථිර ලෙස ම සවි කර ඇති හෝ තබා ඇති සහ කලින් කළ ගෙන එනු ලබන සෑම සහ සියලු අකාරයකම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ , සවි කිරීම් ඇමුණුම් සහ සේවා සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ද ඇතුළු වේ.

2017.12.15 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් ජනගන් අමලෙයි විසින් සහතික කරන ලද අංක 254 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සවුන්දර හෙන්නැදිගේ සනත් ප්‍රියන්ත සිල්වා විසින් පැහැර ඇති හෙයින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2018 ක්වූ අගෝස්තු මස 17 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2018.06.22 වැනි දින ශ්‍රී ලංකා ආණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2018.06.11 වැනි දින ද අයිලන්ඩ් දිවයින, සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨවන මාර්ගය*.- කැලණිය රජමහවිහාර මංසන්දියේ සිට බියගම පාර ඔස්සේ මීටර් 600ක් පමණ ගමන් කර (ශාන්ත තෙරේසා පල්ලිය) (රතු පල්ලිය) ඉදිරියෙන් හැරී (කොටසක් තාර දමා ඇති කොටසක් ගල් අතුරා ඇති) අඩි 15ක් පළලැති පාරේ මීටර් 300ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :-

(01) ගැණුම් මුදලින් 10% ක් ද, (02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද, (03) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (04) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (05) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක්ද, (06) විකිණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ, අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී කළමනාකරු මධ්‍යගත ණය අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 2448448, 011 - 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082
ෆැක්ස් අංකය : 2871184

07-911

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

අංක 2183/757/146 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ මහනුවර මහ නගර සභා සීමාවට අයත්, 236 බහිරවකන්ද ග්‍රාම නිලධාරි වසමේ බහිරවකන්දේ පිහිටි නික්කමැඩිත්තේහේන ලෙස හැඳින්වෙන (මහනුවර දිසා අධිකරණයේ නඩු අංක 46228 හි ලොට් අංක 4 හි කොටසක්) බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මොටේ විසින් සාදන ලද 1979 අගෝස්තු මස 26 වැනි දිනැති අංක 2023/A දරන පිඹුරේ ලොට් අංක 4E1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 20

එහි පිහිටි සියල්ල සහිතව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. හනීෆා බීබීගේ ඉඩමේ ලකුණු කර ඇති අඩි 4ක් පළල ප්‍රවේශය සමග

ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග ප්‍රසිද්ධ නොතාරිස් බී. එස්. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2014 ඔක්තෝබර් මස 27, 2014 ඔක්තෝබර් මස 30, 2014 නොවැම්බර් මස 07 දිනැති අංක 2183/757/146 දරන උකස්කරයන් ප්‍රකාර, මහනුවර පදිංචි මේරි ඈන් දිලීෂියා වික්‍රමසිංහ සහ පතිරවත්තේ සමන් පතිරණ හෙවත් පතිරණවත්තේ සමන් පතිරණ (මින්මතු බද්ධ ණයගැතියන් ලෙස හැඳින්වෙන) විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 අගෝස්තු මස 14 වැනි දින (අඟහරුවාද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. රු. 97,000.00ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාරත්මේන්තුව අමතන්න. දුරකතන අංක 011- 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 A, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-819

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ත්‍රිකුණාමලයේ සිට ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීවී 69898 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ට්‍රිංකො බීච් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැකුවට සුරක්ෂිත කර ඇත.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ නව ලාර් පාර වරිපනම් අංක 810/8 දරන ලොට් බී සහ අහම්පරම් පාර වරිපනම් අංක 810/4 දරන ලොට් ඒ දරන ත්‍රිකුණාමලය නගරය කොට්ඨාස අංක 12 පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එස්. කමලරංගන් විසින් සාදන ලද 2006.02.26 දිනැති අංක 168 දරන සැලැස්මේ සඳහන් ලොට් බී සහ බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ආර්. පොන්නුසාමි විසින් සාදන ලද 2008.11.25 දිනැති අංක 1968 සැලැස්මේ සඳහන් අනන්‍ය ලොට් ඒ හි නැවත මැනීමක් වන සහ නැවත පැහැදිලි කිරීමක් වන ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ආර්. පොන්නුසාමි විසින් අඳින ලද 2009.10.26 දිනැති අංක 2057 සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ බී ලකුණු කළ නිව් සී ලෝඩ් හොටෙල් හෙවත් කුතිරයිකුන්ඩු සහ විරගතියාර් වලව් නැමති ඉඩම් කැබලි දෙක (02) ලොට් ඒ අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් තිහයි දශම හයයි දෙකක් (අ.02, රූ.01, පර්.30.62) (හෙක්ටයාර් 0.98800) සහ ලොට් බී රූඩ් දෙකයි පර්චස් තිස් නවයයි (අ.0, රූ.02, පර්.39) (හෙක්ටයාර් 0.30098).

එකී නිව් සී ලෝඩ් හොටෙල් හෙවත් කුතිරයිකුන්ඩු සහ විරගතියාර්වලවු, දැන් ට්‍රිංකො බීච් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ඉඩම එක් (01) ඉඩම් කොටසක් සේ නැවත මැන ඇති අතර,

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ ත්‍රිකුණාමලය නගර සභා සීමාව තුළ, 243 සොලයියාඩි ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ අහම්පරම් පාර, වරිපනම් අංක 810/4 සහ 810/8 දරන ත්‍රිකුණාමලය නගරය කොට්ඨාස අංක 12 පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ආර්. පොන්නුසාමි විසින් අඳින ලද 2009.10.26 දිනැති අංක 2057 සැලැස්මේ එකතු කළ ලොට් ඒ සහ ලොට් බී වල නැවත මැනීමක් සහ නැවත පැහැදිලි කිරීමක් වන ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ආර්. පොන්නුසාමි විසින් අඳින ලද 2011.09.08 දිනැති අංක 2204 සැලැස්මේ ලොට් 1 ලකුණු කර ඇති අතර ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් විසිනවයයි දශම හයයි දෙකක් වේ. (අ.03, රූ.0, පර්.29.62) (හෙක්ටයාර්. 1.28898)

ඉහත සඳහන් දේපල 2018 අගෝස්තු මස 16 වැනි දින පස්වරු 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - ත්‍රිකුණාමල බස් නැවතුම්පොළ අසළ සිට උතුරු වෙරළ පාර ඔස්සේ (එනම් පරම් පාර) කි.මී. 3.3 ක් පමණ දුරක් ගොස් 3 වන සැතපුම් කණුව හන්දිය දක්වා පැමිණ දකුණුපසට ඇති පුල්මුඩේ පාරට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 170 ක් පමණ දුරක් ගොස් දකුණුපසට ඇති සොලයියාඩි පාරට හැරී තවත් මීටර් 150ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* - රජයේ *ගැසට් පත්‍රයේ* 2018.06.22 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.06.11 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.06.11 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00
6. සියලුම ප්‍රචාරක වියදම්,

7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු.ක. 011 2456465, 2456472

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

07-937

නඩු අංකය ඃ
DMB/231/2014



**කොළඹ දිසා අධිකරණයේ දී ය**

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

පෙර

එම් සී එස් එල් ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ් සහ මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03

නඩු අංකය ඃ
DMB/
231/2014

..........................පැමිණිලිකරු.

-එදිරිව-

1. මිහිඳුකුලසූරිය අනෝජා ක්‍රිස්මලී
2. මිහිඳුකුලසූරිය මේරි තෙරේසා නිර්මන් මැල් දෙදෙනාම

අංක 63/35, ජයසමරුගම, කඳාන

.....................විත්තිකරුවන්.

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින දරන කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාර රුපියල් 3,068,815.23 ක මුදලක් සහ 2014.04.01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොලිය සහ නඩු ගාස්තු පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා විත්තිකරුවන්ට විරුද්ධව ප්‍රකාශ කරණ ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල පැමිණිලිකාර බැංකුවට අය කර ගැනීම සඳහා මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී පත්‍රයේ බලය පිට මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති විත්තිකරුවන්ට අයත් නිශ්චල දේපල.

වර්ෂ 2018 ක්වූ අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 11.00 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

*ඉඩමට පිවිසීම.* - කඳාන නගරයේ සිට රෝහල පාරේ මීටර් 400 ක් පමණ ගිය පසු දකුණු දෙසට ඇති අතුරු මාර්ගයේ තවත් මීටර් 200ක් පමණ ගොස් නැවත දකුණු දෙසට ඇති අතුරු මාර්ගයේ මීටර් 5ක් පමණ ගිය පසු වම් අත පැත්තේ ව. අ. 63/35 දරන මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපළ මිල දී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙනදේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.
2. නොතාරිස් ගාස්තු සහ වෙන්දේසි කොන්දේසි සකස් කිරීමේ ගාස්තු,
3. වෙන්දේසිකරුගේ ගමන් ගාස්තු ඇතුළු සියලුම ප්‍රචාරන වියදම්,
4. අදාල පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ගැණුම් මිලට 1% ක ගාස්තුව,
5. වෙන්දේසිකරුගේ ගාස්තු ගැණුම් මිලට 2.5%ක්,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රයිගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳාන ජයසමරුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දිස්ත්‍රික් සංවර්ධන සභාව (කඳාන අංක 3 දරන උප කාර්යාලය) තුළ නාගොඩ කඳාන පිහිටි ''අනියකන්ද වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. ගුණදස මහතා විසින් 1987 ක් වූ අගෝස්තු මස 31 වැනි දින මැන සාදන ලද අංක 1039 දරන පිඹුරේ කැබලි අංක 33 ට මායිම්, උතුරට ඃ පිඹුරු අංක 1039 හි කැබලි අංක 34 පාර, නැගෙනහිරට ඃ පිඹුරු අංක 1039 හි කැබලි අංක 28 සහ 30 දකුණට පිඹුරු අංක 1039 හි කැබලි අංක 32 සහ බටහිරට ඃ පිඹුරු අංක 1039 හි කැබලි අංක 23 යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර්. 0.0254 ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 82/67 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධිකරණයේ අණ පරිදි,

ජේ. ඩබ්. ඊ. ජයවර්ධන,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

දුරකතන අංක ඃ 091 2277105, 077 9663420, 071 3358434

07-898

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මෙම දේපල පික්සාර් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී

ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සහා සීමාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 522 බී තුළ පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2009.03.19 දිනැති අංක 4511 දරන සැලැස්මේ නිරූපණය වන කුඩාවලවත්ත හෙවත් කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 22 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයක් (අ.0, රූ.0, පර්.10) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. ඉහත සඳහන් ඉඩම පිඹුරු අංක (සීඕ) 169 ඒහි සඳහන් ලොට් 22 හි නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් දේපල 2018 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 1.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - බොරැල්ල සිට ශ්‍රී ජයවර්ධනපුර පාර ඔස්සේ ඇතුල් කෝට්ටේ දක්වා පැමිණ කෝට්ටේ පාරට පිවිසෙන්න. එම කෝට්ටේ පාර දිගේ තවත් කි.මී. 2ක පමණ දුරක් ගොස් දකුණු පසට ඇති එපිටමුල්ල පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 200ක පමණ දුරක් ගිය විට වම්පසට ඇති 4 වන පටමග හමුවේ. එම මාර්ගයේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට වම්පසින් දෙවන ඉඩම් කොටස ලෙස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* - රජයේ ගැසට් පත්‍රයේ 2018.06.08 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.21 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.05.24 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතු ය. :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000,
6. සියලුම ප්‍රචාරක වියදම්

7. ගැණුම් මිලෙන් ඉතිරි 90% වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456465, 2456472.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940

07-938

---

## සෙලාන් බැංකුව පීඑල්සී - පුද්ගලික බැංකු ව්‍යාපාර ඒකකය

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල කොළඹ 04 පදිංචි ක්‍රිස්ටි රාජසේබාර් ගනේෂලිංගම් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ හැව්ලොක් ටවුන් ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කොළඹ මහ නගර සහා සීමාව තුළ බම්බලපිටිය දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩැනියෙල් විසින් සාදන ලද 1929 ඔක්තෝබර් මස 16 වැනි දිනැති අංක 2788 සැලැස්මේ නිරූපණය වන කිංරොස් ඇවනිව් වරිපනම් අංක 20 සහ 20/1 දරන දැන් ඒකක දෙකකින් සමන්විත බම්බලපිටිය කිංරොස් ඇවනිව් වරිපනම් අංක 20 දරන නිවාස සමඟ ඉඩම් කොටස පර්චස් විසිහයයි දශම හයයි පහක් (අ.0, රූ.0, පර්.26.65) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2018 අගෝස්තු මස 13 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - කොල්ලුපිටිය මංසන්ධියේ සිට මැරයින් ඩ්‍රයිව් මාර්ගයට හැරී වැල්ලවත්ත දෙසට කි.මී. 3.6ක පමණ දුරක් ගොස් වම්පසින් ඇති කිංරොස් ඇවනිව් එකට හැරී තවත් මීටර් 150ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2018.06.21 වැනි දින පළවී ඇති අතර, දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත්වල 2018.06.13 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.06.13 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතු ය. :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00
6. සියලුම ප්‍රචාරක වියදම්

ගැණුම් මිලෙන් ඉතිරි 90% වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න ඃ ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු.ක. 011 2456465, 2456472.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක ඃ 011-3068185, 011-2572940.

07-935

## සෙලාන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව

1990 අංක 04 දරන බැංක මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මෙම දේපල කොළඹ 04 පදිංචි නානායක්කාරවසම් එගොඩගේ ඉනෝකා සෙව්වන්දි යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළේ, රාගම පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල ගලහිටියාව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 2009.09.08 දිනැති අංක 16315 දරන සැලැස්මේ නිරූපණය වන කජුගහලන්ද නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.13.75) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියළුම දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපල 2018 අගෝස්තු මස 15 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - ගනේමුල්ල දුම්රිය හරස් මාර්ගය අසළ සිට කඩවත - කිරිදිවිට මාර්ගය ඔස්සේ කිරිදිවිට දෙසට මීටර් 200ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2018.06.22 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.06.13 වැනි දින ද තිනක්කුරල් පුවත්පතේ 2018.06.13 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතු ය ඃ

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00
6. සියලුම ප්‍රචාරක වියදම්

ගැණුම් මිලෙන් ඉතිරි 90% වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු.ක. 011 2456465, 2456472.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

07-936

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.